# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කලේ 2004 නොවැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 නොවැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 8.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2004 නොවැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 23/2004.

**ඡන්දදායකයකු විසින් ඡන්ද විමසීමක දී අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කළ යුතු බවට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සහ 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තු පනතක් වශයෙන් මේ පනත සහතික කරන දින සිට එක් අවුරුද්දක කාලයක් අවසාන වූ විට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

## පොදු විධිවිධාන

**2.** (1) ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති සියලු තැනැත්තන් විසින් හැඳුනුම්පත් ලබා ගැනීම සහ ඔවුන් විසින් ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් වැළැක්වී නොමැති බව තහවුරු කර ගැනීම පිණිස, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් සියලු පරිපාලන වැඩ පිළිවෙල සපුරා ඇති බවට මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමට පෙර මැතිවරණ කොමිෂන් සභාව සෑහීමට පත් විය යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාව විසින් එම කරුණු සහතික කරමින් එම සහතිකය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය :

මැතිවරණ කොමසාරිස්වරයා විසින් සහතික කිරීම.

එසේ වුව ද, එසේ සහතික කිරීමට පෙර හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා යොදා ඇති පරිපාලන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ අදහස් වලට මැතිවරණ කොමිෂන් සභාව විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සහතිකය පළ කිරීමට පෙර, මේ වගන්තිය ප්‍රකාරව අදහස් කරනු ලබන වැඩ කටයුතු සිදු කර ඇති බවට සහතිකයක් නිකුත් කිරීම මගින් එම කරුණ මැතිවරණ කොමිෂන් සභාවට

2-H 22827 - 4,500 (2004/08)

ස්ථිර කරන ලෙස 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාට මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය යුතු ය. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාගේ සහතිකය මේ වගන්තිය ප්‍රකාරව අදහස් කරනු ලබන පරිපාලන වැඩ පිළිවෙල සිදු කර ඇති බවට සියලු මැතිවරණ කොට්ඨාසවලට අදාළව තමා වෙත ලැබුණු වාර්තා මත පදනම් විය යුතු ය.";

වලංගු අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කළ යුතු බව.

**3**. වෙනත් යම් නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද—

(අ) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා පැවැත්වෙන ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තකුම ; හෝ

(ආ) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පළාත් සභා සඳහා මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සඳහා පැවැත්වෙන ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තකුම ; හෝ

(ඇ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ ඒ ඒ පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා පත්කර ගැනීම සඳහා පැවැත්වෙන ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තකුම ; හෝ

(ඈ) 1981 අංක 15 දරන, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත යටතේ ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා පැවැත්වෙන ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තකුම ; හෝ

(ඉ) 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත යටතේ පැවැත්වෙන ජනමතවිචාරණයක දී ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තකුම,

මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට සහ ඉන්පසු ඡන්ද දායකයකු වශයෙන් තමා වෙත ඡන්ද පත්‍රිකාවක් භාරදෙනු ලැබීමට ප්‍රථම, අදාළ මධ්‍යස්ථානයේ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු වෙත, වලංගු අනන්‍යතා ලේඛනයක්, පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**4**. 3 වන වගන්තියේ කාර්ය සඳහා "වලංගු අනන්‍යතා ලේඛනය" යන්නෙන්, කවර වූ හෝ කාර්යයක් සඳහා, එය දරන්නාගේ අනන්‍යතාව නිශ්චය කර ගැනීම පිණිස, යම් නීතියක් ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරනු ලැබූ අනන්‍යතා ලේඛනයක් අදහස් වන අතර, ඊට වෙනත් යම් අනන්‍යතා සහතිකයක් නොමැති තැනැත්තකුගේ ඡායාරූපයක් එම තැනැත්තාගේ ඡායාරූපය බවට අවස්ථාවෝචිත පරිදි ග්‍රාම නිලධාරිවරයා විසින් හෝ වතු අධිකාරිවරයා විසින් යථා පරිදි සහතික කොට එම තැනැත්තා පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් සත්‍යායනය කරන ලද ලේඛනයක් ද ඇතුළත් විය යුතු ය. අර්ථ නිරූපණය.

මෙම විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු කාලය අවශ්‍ය සහ අදාළ පුද්ගලයන් විමසා මැතිවරණ කොමිසම පත් කිරීමෙන් පසු එම කොමිසම විසින් තීරණය කළ යුතු ය.

**5**. (අ) වෙනත් යම් අනන්‍යතා ලේඛනයක් තම සන්තකයේ නොමැතිව ව්‍යාජ තොරතුරු පදනම් කරගෙන අනන්‍යතා ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන ; සහ වැරදි.

(ආ) අනන්‍යතා ලේඛනයක් තම සන්තකයේ නොමැති තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඡායාරූපයක් සහතික කරන හෝ සත්‍යායනය කරන සහ එම සහතිකය හෝ සත්‍යායනය කිරීම අසත්‍ය වන අවස්ථාවක එම සහතික කිරීම හෝ සත්‍යායනය කිරීම කරන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පණස්දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ මාස එකකට නොඅඩු සහ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

## II වන කොටස

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම

**6**. මින් ඉදිරියට මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 37 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 1 දරන පනතේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) ඡන්දදායකයාගේ වලංගු අනන්‍යතා ලේඛනයක් පරීක්ෂා කර බලා, නම සහ අනන්‍යතාව නිශ්චය කරගත යුතුය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "උචිත පරීක්ෂණය කිරීමට ඉඩදීම" යන වචන වෙනුවට "උචිත ලකුණ පරීක්ෂා කිරීමට හෝ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති" යන වචන වෙනුවට, "ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව හෝ ඒ ඡන්දදායකයාගේ අනන්‍යතාව පිළිබඳව සැක මතුවන කරුණු පවත්නා බව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ "ඇ" ආකෘති පත්‍රය සංශෝධනය කිරීම.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, එහි "ඇ"ආකෘති පත්‍රයේ "ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව" යන ශීර්ෂය යටතේ ඇති තීරුව යටතට "වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැත හෝ අනන්‍යතාව තහවුරු වී නැත" යන ශීර්ෂය යටතේ අලුතෙන් තීරුවක් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## III වන කොටස

### 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත සංශෝධනය කිරීම

1981 අංක 15 දරන පනතේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. මෙහි මින් ඉදිරියට මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 35 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අඅ) ඡන්දදායකයාගේ වලංගු අනන්‍යතා ලේඛනයක් පරීක්ෂා කර බලා, නම සහ අනන්‍යතාව නිශ්චය කර ගත යුතු ය ;".

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, "උචිත පරීක්ෂණය කිරීමට ඉඩදීම" යන වචන වෙනුවට "උචිත පරීක්ෂණය කිරීමට හෝ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ වන විටත් උචිත සලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව" යන වචන වෙනුවට "ඒ වන විටත් උචිත සලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව හෝ ඒ ඡන්දදායකයාගේ අනන්‍යතාව පිළිබඳව සැක මතුවන කරුණු පවත්නා බව" යන වචන ආදේශ කිරීමෙන්.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, එහි "ඇ" ආකෘති පත්‍රයේ "ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව" යන ශීර්ෂය යටතේ ඇති තීරුව යටතට "වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැත හෝ අනන්‍යතාව තහවුරු වී නොමැත" යන ශීර්ෂය යටතේ අලුතෙන් තීරුවක් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ "ඇ" ආකෘති පත්‍රය සංශෝධනය කිරීම.

## IV වන කොටස

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම

**12**. මෙහි මින් ඉදිරියට මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 35 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1988 අංක 2 දරන පනතේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) ඡන්දදායකයාගේ වලංගු අනන්‍යතා ලේඛනයක් පරීක්ෂා කර බලා, නම සහ අනන්‍යතාව නිශ්චය කරගත යුතු ය ;".

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "උචිත පරීක්ෂණය කිරීමට ඉඩදීම" යන වචන වෙනුවට "උචිත පරීක්ෂණය කිරීමට හෝ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව" යන වචන වෙනුවට "ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව හෝ ඒ ඡන්දදායකයාගේ අනන්‍යතාව පිළිබඳව සැක මතුවන කරුණු පවත්නා බව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ "ඇ" ආකෘති පත්‍රය සංශෝධනය කිරීම.

**14**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, එහි " ඇ " ආකෘති පත්‍රයේ " ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව" යන ශීර්ෂය යටතේ ඇති තීරුව යටතට " වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැත හෝ අනන්‍යතාව තහවුරු වී නොමැත " යන ශීර්ෂය යටතේ අලුතෙන් තීරුවක් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## V වන කොටස

## (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම.

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15**. මෙහි මින් ඉදිරියට මේ කොටසෙහි " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් —

"(1අ) ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නැතහොත් ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් යම් ඡන්ද දායකයකුට ඡන්ද පත්‍රිකාව භාරදීමට ප්‍රථම, ඔහුගේ නම සහ අනන්‍යතාව නිශ්චය කර ගැනීම පිණිස, වලංගු අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඒ ඡන්දදායකයාට නියම කළ යුතු ය.";

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "එකී යම් ප්‍රකාශයක් කිරීම යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කරතහොත්," යන වචන වෙනුවට, " එවැනි යම් ප්‍රකාශයක් කිරීම හෝ වලංගු අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කිරීම යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කරතහොත්," යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ පැති සටහනෙහි " ප්‍රකාශයක් කරන ලෙස " යන වචන වෙනුවට " ප්‍රකාශයක් කරන ලෙස සහ වලංගු අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස" යන වචන ආදේශ කිරීමෙන්.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පරීක්ෂණය කිරීමට ඉඩදීම යම් ඡන්දදායකයකු ප්‍රතික්ෂේප කළහොත් ; හෝ " යන වචන වෙනුවට " පරීක්ෂණය කිරීමට ඉඩදීම හෝ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම යම් ඡන්දදායකයකු ප්‍රතික්ෂේප කළහොත් ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ " උචිත ලකුණෙන් ඒ ඡන්දදායකයා ඒ වන විටත් සලකුණු කරනු ලැබ ඇති බව " යන වචන වෙනුවට " උචිත ලකුණෙන් ඒ ඡන්දදායකයා ඒ වනවිටත් සලකුණු කර ඇති බව හෝ ඒ ඡන්දදායකයාගේ අනන්‍යතාව පිළිබඳව සැක මතුවන කරුණු පවත්නා බව" යන වචන ආදේශ කිරීමෙන්.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය, එහි " ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව" යන ශීර්ෂය යටතේ ඇති තීරුව යටතට " වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැත හෝ අනන්‍යතාව තහවුරු වී නොමැත" යන ශීර්ෂය යටතේ අලුතෙන් තීරුවක් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය සංශෝධනය කිරීම.

## VI වන කොටස

### 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත සංශෝධනය කිරීම

18. මෙහි මින් ඉදිරියට මේ කොටසෙහි " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනතේ 20 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 7 දරන පනතේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (අඅ) ඡන්දදායකයාගේ වංලගු අනන්‍යතා ලේඛනයක් පරීක්ෂා කර බලා, නම සහ අනන්‍යතාව නිශ්චය කරගත යුතු ය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ " උචිත පරීක්ෂණය කිරීමට ඉඩදීම" යන වචන වෙනුවට " උචිත පරීක්ෂණය කිරීමට ඉඩදීම හෝ වලංගු අනන්‍යතා ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව" යන වචන වෙනුවට " ඒ වන විටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව හෝ ඒ ඡන්දදායකයාගේ අනන්‍යතාවය පිළිබඳ සැක මතුවන කරුණු පවත්නා බව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛණයේ "ආ" ආකෘති පත්‍රය සංශෝධනය කිරීම.

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය, එහි " ආ " ආකෘති පත්‍රයේ " ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව " යන ශීර්ෂය යටතේ ඇති තීරුව යටතට " වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැත හෝ අනන්‍යතාව තහවුරු වී නොමැත " යන ශීර්ෂය යටතේ අලුතෙන් තීරුවක් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.